# අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රදේශයේ හඳුනාගත් නව පුරාවිද්‍යා ක්ෂේත්‍ර පිළිබඳව මූලික අධ්‍යයනය

බුද්ධික ධනංජය රණසිංහ[1]
එච්. එම්. සී. ඩී. හේරත් [2]

[1]පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
[2]කළමනාකරණ පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

---

කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා ගවේෂක සංගමය විසින් නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයට අයත් නුගේවල නම් ස්ථානය පුරාවිද්‍යාත්මකව හඳුනාගනු ලැබිණි. මේ ස්ථානය පිළිබඳව මින් පෙර පුරාවිද්‍යා අවධානයක් යොමු වී නොමැති හෙයින් ක්ෂේත්‍ර පිළිබඳ මූලික ගවේෂණයක් ලෙස පර්යේෂණය දියත් කරනු ලැබිණි. ඒ සඳහා අනුගමනය කළ ක්‍රමවේද අතර ක්‍ෂේත්‍රගතව ගවේෂණ කටයුතු සිදුකිරීමත්, ස්ථානයට අදාළ වියහැකි ලිඛිත මූලාශ්‍ර අධ්‍යනයත් මේ ස්ථානය පිළිබඳ ගම්වාසීන්ගෙන් තොරතුරු දැනගැනීමත් මූලික විය. මේ ස්ථානයේ මතුපිට පුරාවිද්‍යාත්මක සාධක විසිරී පැවතුණි. කටාරම් කොටන ලද ගල් ලෙනක් සහ ස්තූපයක නටඹුන් හඳුනාගත හැකි විය. සඳකඩපහණක් හා මුරගල් හා ගල් කණු විශාල ප්‍රමාණයක් මේ පුරාවිද්‍යා ක්‍ෂේත්‍රය පුරා විසිරී තිබුණි. මෙම ක්‍ෂේත්‍රයෙන් මෙගලිතික සුසානයක් ද හඳුනාගනු ලැබිණි. ඉදිරියේ මෙම ප්‍රදේශයේ විධිමත් ගවේෂණයක් කිරීමට අපේක්ෂා කරමු.

ප්‍රමුඛ පද : නුගේවල, ඓතිහාසික යුගය, මෙගලිතික සුසාන